## 5 පරිච්ඡේදය

# භික්ෂු අධ්‍යාපනය සහ ආධ්‍යාත්මික ජීවිතය

පොළොන්නරු, දඹදෙණි යුගවල දී පැවිදි ජීවිතය උසස් කරලීම සඳහා මහත් පැලකිල්ලක් දක්වා ඇත. පැවිදි වූ තැන් සිට හෝ ඊටත් පෙර සිට මහණෙර, මාහිමි පදවි දක්වා වූ විවිධ අවස්ථා අනුව පැවිද්දන්ට මහණදම් සම්බන්ධ නොයෙක් අංශවල පුහුණුවක් ලබා දෙන ලදි. ගුණධර්ම පිළිබඳ දියුණුව, ධර්මඥානය ලැබීම, බණ භාවනාවල යෙදීම සහ වත්පිළිවෙත් පිරීම ඒ පුහුණුවෙන් අපේක්ෂිත වූ ප්‍රධාන කාරණා ය. සෑම භික්ෂුවක් ම ග්‍රන්ථ, විදර්ශනා ධුර දෙකෙන් එකකට අයත්විය යුතු වූ අතර පැවිදි ජීවිතය හා සම්බන්ධව විවිධ අවස්ථා අනුව තව බොහෝ සුදුසුකම් අපේක්ෂා කළ බව පෙනේ.

පැවිදි වීමට පෙර ශ්‍රමණ ජීවිතයට පුහුණු කරවීමක් ගැන පොළොන්නරු කතිකාවතෙහි දක්නට නො ලැබේ. දඹදෙණි කතිකාවත අනුව ඒ පුහුණුව දීම වැදගත් කොට සලකන ලදි. දඹදෙණි කතිකාවතෙන් හෙළිවන පරිදි අධ්‍යාපනය අතින් මෙන් ම ගුණධර්ම අතින් ද පැලකිය යුතු දියුණුවක් **පණ්ඩුපලාසයා** (ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා) තුළ තිබිය යුතු විය. ඒ අනුව **පණ්ඩුපලාසයා** විසින් **ඇණවුම් සකස්කඩ, සතරබණවර, ධම්පියා** සහ **කතිකා බණ** පුහුණු කළ යුතු විය[1] V කාශ්‍යපගේ (ක්‍රි. ව. 914-923) අනුරාධපුර පුවරු ලිපිය අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගයේ දීත් ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයාට පිරිත් **සතර බණවර** ගැන දැනීමක් (පිරිත් සතර් බණ්වර් පිළිසිය් වුවන්) තිබිය යුතු විය.[2] පොළොන්නරු කතිකාවතේ එවැනි පුහුණුවක් ගැන සඳහන් නො වේ.

දඹදෙණි කතිකාවත අනුව ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයාගෙන් තව බොහෝ සුදුසුකම් අපේක්ෂා කළ බව පෙනේ. ඔහු **ගණසංගණිකා** (පිරිස්වල ඇලී ගැලී සිටීම), **භස්සාරාමතා** (සල්ලාප ප්‍රියත්වය හෝ දොඩමළු බව) ආදියෙන් තොර විය යුතු ය. පැවිදි වූ පළමු දවසෙහි වුවත් සිසිවෙකුගෙන් දෝෂාරෝපණයක් අසන්නට නොලැබෙන තරමට ඔහුට වත්පිළිවෙත් පුරුදු කළ යුතුයි. ඊළඟට චාරිත්‍රානුකූලව පැවිදි කිරීමේ කටයුතු අරඹනු ලැබේ. පළමුවෙන් සිදු කරන්නේ තෙර තුන් නමක් ඇතුළු 'උපයුක්ත සංඝයා' මධ්‍යයෙහි **ජාති-ගෝත්‍ර** (පාළි, **ජාතිගොත්ත**) විචාරීමයි.[3] බොහෝ උගතුන් විවරණය කර ඇති

---

1. මෙහි සඳහන් ඇණවුම් සකස්කඩ, සතර බණවර, ධම්පියා සහ කතිකාවත මෙහි අග ගැටපදයෙහි හඳුන්වා ඇත.
2. EZ. I, No. 4, p. 45.
3. උපසා. 186 පි. මෙහි උපයුක්ත සංඝයා නමින් හැඳින්වෙන්නේ පැවිදි කර්මයට සහභාගී වන සංඝයා වහන්සේ ය. එහි යටත් පිරිසෙයින් තෙරවරුන් තුන් නමක් සිටිය යුතුයි.